## B කොටස - රචනා

05. (a) $NOCl$ වායු සාම්පලයක් පරිමාව $1 \times 10^{-3} m^3$ වන දෘඪ සංවෘත භාජනයක් තුළ පහත දැක්වෙන සමතුලිතතාවයට එළඹීම සඳහා 208℃ දක්වා රත් කරන ලදී.

$$2NOCl_{(g)} \rightleftharpoons 2NO_{(g)} + Cl_{2(g)}$$

සමතුලිත අවස්ථාවේ දී පද්ධතියේ මුළු පීඩනය $1.2 \times 10^5 Pa$ ද $Cl_{2(g)}$හි ආංශික පීඩනය $2 \times 10^4 Pa$ ද විය.( 208℃ හි දී RT $= 4 \times 10^3 Jmol^{-1}$)

(i) සමතුලිත අවස්ථාවේ $NOCl_{(g)}$ හා $NO_{(g)}$ හි ආංශික පීඩන ගණනය කරන්න.

(ii) සමතුලිත අවස්ථාවේ දී $NOCl_{(g)}$ , $NO_{(g)}$ හා $Cl_{2(g)}$ යන මේවායේ සාන්ද්‍රණ ගණනය කරන්න.

(iii) ඉහත සමතුලිතතාව සඳහා Kp හා Kc ගණනය කරන්න

(iv) මෙම සමතුලිත වායු මිශ්‍රණයට $NOCl_{(g)}$ $1\times 10^{-3} mol$ ක් හා $Cl_{2(g)}$ $5\times 10^{-3} mol$ එක්කළ විට ඉහත සමතුලිතය කුමන දිශාවට නැඹුරු වේ දැයි සුදුසු ගණනය කිරීමක් ඇසුරින් ලියා දක්වන්න.

(b) $CH_3COOH_{(aq)}$ දුබල අම්ලයේ විඝටනය සඳහා එන්තැල්පි හා එන්ට්‍රොපි දත්ත පහත දී ඇත.

| | $\Delta H^{\theta}/kJmol^{-1}$ | $\Delta S^{\theta}/Jmol^{-1}K^{-1}$ |
|---|---|---|
| $CH_3COOH_{(aq)} \rightarrow CH_3COO^-_{(aq)} + H^+_{(aq)}$ | 1 | 95 |
| $CH_3COO^-_{(g)} \rightarrow CH_3COO^-_{(aq)}$ | -200 | -2000 |
| $H^+_{(g)} \rightarrow H^+_{(aq)}$ | -1100 | -1200 |
| $CH_3COOH_{(g)} \rightarrow CH_3COOH_{(aq)}$ | -150 | -100 |

(i) වායු කලාපයේ දී $CH_3COOH$ හි විඝටනය සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

(ii) වායු කලාපයේ දී $CH_3COOH$ හි විඝටනය සඳහා පහත සඳහන් දෑ ගණනය කරන්න.

I. එන්තැල්පි වෙනස ($\Delta H^{\theta}$)

II. එන්ට්‍රොපි වෙනස ($\Delta S^{\theta}$)

III. 300K හි දී ගිබ්ස් ශක්ති වෙනස ($\Delta G^{\theta}$)

(iii) 300K හි දී වායු කලාපයේ දී $CH_3COOH$ හි විඝටනයෙහි ස්වයංසිද්ධභාවය පිළිබඳව අදහස් දක්වන්න. (හේතු දක්වන්න)

(iv) 300K හි දී ජලීය කලාපයේ $CH_3COOH$ හි විඝටනය සඳහා ගිබ්ස් ශක්ති වෙනස ගණනය කරන්න.

(v) වායු කලාපයේ දී $CH_3COOH$ හි විඝටනය සඳහා ගිබ්ස් ශක්ති වෙනස ජලීය කලාපයේ දී එහි විඝටනය සඳහා ගිබ්ස් ශක්ති වෙනසට සමාන වන්නේ කුමන උෂ්ණත්වයේ දී ද? මෙහි දී ඔබ සිදුකළ උපකල්පන මොනවාද?

AL API ( PAPERS GROUP )

CamScanner

06. (a) පහත දැක්වෙන ප්‍රතික්‍රියාව සලකන්න.

$$A_{(aq)} + B_{(aq)} \rightarrow P_{(aq)}$$

මෙම ප්‍රතික්‍රියා මිශ්‍රණයේ $A_{(aq)}$ සහ $B_{(aq)}$ හි විවිධ ආරම්භක සාන්ද්‍රණ සඳහා ලබා ගන්නා ලද චාලක විද්‍යාත්මක දත්ත පහත වගුවේ දක්වා ඇත.

| පරීක්ෂණ අංකය | උෂ්ණත්වය / °C | ආරම්භක සාන්ද්‍රණය/ $moldm^{-3}$ | | | ආරම්භක සීඝ්‍රතාවය / $moldm^{-3}s^{-1}$ |
|---|---|---|---|---|---|
| | | $A_{(aq)}$ | $B_{(aq)}$ | $C_{(aq)}$ | |
| 1 | 30 | 1.0 | 0.50 | - | 0.0020 |
| 2 | 30 | 0.50 | 0.50 | - | 0.0010 |
| 3 | 30 | 0.50 | 1.0 | - | 0.0040 |
| 4 | 30 | 0.50 | 1.0 | 0.50 | 0.02 |
| 5 | 30 | 0.50 | 1.0 | 1.0 | 0.02 |
| 6 | 50 | 0.50 | 1.0 | - | 0.016 |

පරීක්ෂණ අංක 4 හා 5 C නම් ද්‍රව්‍ය හමුවේ සිදුකරන ලදී.

(i) ඉහත ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය සඳහා ගණිතමය ප්‍රකාශනයක් $A_{(aq)}$ හා $B_{(aq)}$ හි සාන්ද්‍රණ ඇසුරින් ලියන්න.

(ii) $A_{(aq)}$ හා $B_{(aq)}$ යන එක් එක් ප්‍රතික්‍රියකයට සාපේක්ෂව 30°C දී ඉහත ප්‍රතික්‍රියාවේ පෙළ ගණනය කරන්න.

(iii) ඉහත C හි කාර්යය කුමක් ද?

(iv) පරීක්ෂණ 3 හා 6 හි සීඝ්‍රතා ප්‍රතිඵලය පැහැදිලි කරන්න.

(b) රූපයේ දැක්වෙන පරිදි 298K දී Fe ඇනෝඩයක් භාෂ්මික ජලීය විද්‍යුත් විච්ඡේද්‍යයක් හා වාතයේ ඇති $O_2$ වායුව ලබා ගැනීමට උපකාර වන සවිවර pt කැතෝඩයක් භාවිතයෙන් විද්‍යුත් රසායනික කෝෂයක් ගොඩනඟන ලදී. කෝෂය ක්‍රියාත්මක වනවිට $Fe(OH)_3$ සෑදේ.

$E^{\emptyset}_{|OH^-_{(aq)}|Fe(OH)_{3(s)}|Fe_{(s)}} = -0.04V$ $\quad$ $E^{\emptyset}_{O_{2(g)}|OH^-_{(aq)}} = +0.40V$

(Fe =56 , O=16, H=1) F=96500$Cmol^{-1}$




(i) ඇනෝඩය හා කැතෝඩය මත සිදුවන අර්ධ ප්‍රතික්‍රියා ලියා දක්වන්න.

(ii) සම්පූර්ණ කෝෂ ප්‍රතික්‍රියාව ලියන්න.

(iii) 298K දී කෝෂයේ විභවය $E^{\emptyset}_{cell}$ ගණනය කරන්න.

(iv) 298K දී කෝෂය 1000s කාලයක් තුළ ක්‍රියාත්මක වන විට දී $O_2$ 3 $mol$ වැයවේ.

A. කෝෂය හරහා ගමන් කරන ඉලෙක්ට්‍රෝන මවුල සංඛ්‍යාව ගණනය කරන්න.

B. සෑදෙන $Fe(OH)_3$ හි ස්කන්ධය ගණනය කරන්න.

C. කෝෂය තුළින් ගලන ධාරාව ගණනය කරන්න.

07. (a) $CH_3CH_2CH_2OH$ යන සංයෝගය භාවිත කරමින් පහත ප්‍රතික්‍රියා අනුක්‍රමණයට අනුව W නම් සංයෝගය පිළියෙල කර ඇත.

(i)




AL API ( PAPERS GROUP )

| ත.$H_2SO_4$ / සා.$H_2SO_4$ / $Br_2$ / ම. KOH / Mg / $KMnO_4$ / වියළි $CH_3OCH_3$ / $PBr_3$ / $H_2O$ / $CH_3CH_2CH_2OH$ |
| --- |

දී ඇති ඇති රසායනික ද්‍රව්‍ය සහ තත්ත්ව පමණක් භාවිත කර A, B, C, D, E, F සංයෝගවල ව්‍යුහ සහ $R_1, R_2, R_3, R_4, R_5, R_6, R_7, R_8$ ප්‍රතිකාරක සහ තත්ත්ව හඳුනා ගන්න.

(ii) Y සංයෝගය $Hg^{2+}$ හා ත. $H_2SO_4$ සමඟ ප්‍රතික්‍රියා කළ විට ලැබෙන ඵලයට 2.4 DNP යෙදූ විට ලැබෙන සංයෝගයේ ව්‍යුහය ලියා දක්වන්න.

(b) (i) පියවර 04කට නොවැඩි පියවර ගණනකින් පහත පරිවර්තන සිදු කරන්න.

(a) $CH_3CH_2 - \overset{O}{\overset{\|}{C}} - H \longrightarrow CH_3 - C \equiv C - CH_3$

(b)




උත්ප්‍රේරිත හයිඩ්‍රජනීකරණය භාවිත නොකරමින් පහත පරිවර්තන පියවර 04කට නොවැඩි පියවර ගණනකින් සිදුකරන්න.

(c) $CH_3 - CH = CH_2 \longrightarrow CH_3CH_2CH_3$

(d) $CH_3CH_2CH_2OH \longrightarrow CH_3 - \underset{CH_3}{\underset{|}{C}} = N - CH_3$

(c) $CH_3CH_2OH$ හා HBr අතර ප්‍රතික්‍රියාව සඳහා සුදුසු යාන්ත්‍රණයක් ලියා දක්වන්න. එම ප්‍රතික්‍රියාවේ යාන්ත්‍රණ වර්ගය නම් කරන්න.

08. (a) M නැමති මූලද්‍රව්‍ය ආවර්තිතා වගුවේ 3වන ආවර්තයට අයත් වේ. එහි ඔක්සයිඩයක් Mg සමඟ ප්‍රතික්‍රියා කර වූ විට a නැමති සුදු පැහැ ඵලයක් හා b නම් ලා වර්ණයක් සහිත ඵලයක් ඇති විණි. ((1) ප්‍රතික්‍රියාව) M හි ක්ලෝරයිඩයක් ජලය සමඟ ප්‍රතික්‍රියා කල විට C නම් ද්විභාෂ්මික දුබල අම්ලය ද d නම් ඒක භාෂ්මික ප්‍රබල අම්ලය ද M මූල ද්‍රව්‍ය ද ඇති වේ. (2 ප්‍රතික්‍රියාව). M මූල ද්‍රව්‍ය සාන්ද්‍ර $HNO_3$ සමඟ ප්‍රතික්‍රියා කල විට e නම් ද්වි භාෂ්මික ප්‍රබල අම්ලය සහ f නම් වර්ණවත් වායුවක් සහ 16 වන කාණ්ඩයේ මූල ද්‍රව්‍යයක් අඩංගු වන උභය ප්‍රෝටීන සංයෝගයක් (g) ඇතිවිණි. (3 ප්‍රතික්‍රියාව)

(i) M මූල ද්‍රව්‍යය හඳුනාගෙන එහි සත්‍ය සංකේතය ලියා දක්වන්න.

(ii) M හි සුලභ ඔක්සිකරණ අංක 4ක් ලියන්න.

(iii) a, b, c, d, e, f, g ප්‍රභේද හඳුනාගෙන ඒවා සත්‍ය සංකේත ඇසුරින් ලියන්න.

(iv) (1)/(2)/(3) ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

(b) A නම් ජලීය ද්‍රාවණයක කැටායන 04ක් අඩංගු වේ. මෙම කැටායන හඳුනා ගැනීමට පහත පරීක්ෂණය සිදුකරන ලදී.

| පරීක්ෂණය | නිරීක්ෂණය |
|---|---|
| 1. වැඩිපුර තනුක HCl දැමීම | සුදු අවක්ෂේපයක් (Q) ලැබුණි. |
| 2. Q පෙරා ඉවත්කර පෙරනය තුලින් $H_2S$ වායුව බුබුලනය කිරීම | කළු අවක්ෂේපයක් ලැබුණි.(R) |
| 3. R පෙරා ඉවත්කර $H_2S$ සියල්ල ඉවත්වන තුරු පෙරණය රත්කර එයට සා. $HNO_3$ බිංදු කිහිපයක් දමා ද්‍රාවණය තවදුරටත් රත්කරන ලදී. ලැබුණ ද්‍රාවණය කාමර උෂ්ණත්වයට සිසිල් කර $NH_4Cl/\ NH_4OH$ එකතු කරන ලදී. | රතු-දුඹුරු අවක්ෂේපය (S) ලැබුණි |
| 4. S පෙරා ඉවත්කර පෙරනය තුලින් වැඩිපුර $H_2S$ බුබුලනය කරන ලදී. | අවක්ෂේපයක් නැත |
| 5. ඉහත (4) හි ද්‍රාවණය $H_2S$ ඉවත්වන තුරු නටවා වැඩිපුර $NH_4Cl/\ NH_4OH$ දමා ඉන්පසු $(NH_4)_2CO_3$ එකතු කිරීම | සුදු අවක්ෂේපයක් (T) ලැබුණි |
| 6. A හි අලුත් කොටසකට $K_3[Fe(CN)_6]$ එකතු කිරීම. | තද නිල් අවක්ෂේපයක් ලැබුණි |

Q, R, S, T අවක්ෂේපය සඳහා පහත පරීක්ෂණ සිදුකරන ලදී.

| පරීක්ෂණය | නිරීක්ෂණය |
|---|---|
| Q ට ත. $NH_3$ ද්‍රාවණයක් වැඩිපුර එකතු කිරීම | Q මුළුමනින්ම දියවිය |
| R දියවනතුරු වැඩිපුර ත. $HCl$ දැමීම | R මුළුමනින්ම දියවී වර්ණවත් ද්‍රාවණයක් (U) ලැබේ. මෙයට $NH_3$ වැඩිපුර එකතු කරන විට නිල් පැහැ ද්‍රාවණයක් ලැබුණි. |
| T ඝනය පහන්සිළු පරීක්ෂාවට ලක් කිරීම | කහකොළ වර්ණයක් ලැබුණි. |

(i) A ජලීය ද්‍රාවණයේ අන්තර්ගත කැටායන 04 හඳුනා ගන්න.

(ii) Q, R, S, T අවක්ෂේප නම් කරන්න.

(iii) U ද්‍රාවණයේ වර්ණයත් ඒ සඳහා හේතුවන සංයෝගයත් ලියන්න.

(c) ජලීය ද්‍රාවණයක් තුළ $NO_3^-/C_2O_4^{2-}/CO_3^{2-}$ අයන අඩංගු වේ. එම අයනවල සාන්ද්‍රණය නිර්ණය කිරීමට පහත ක්‍රියා පිළිවෙල යොදා ගන්නා ලදී.

ක්‍රියා පිළිවෙල 01

ඉහත ද්‍රාවණයෙන් 25.0 $cm^3$ ගෙන එයට වැඩිපුර Al කුඩු සහ NaOH දමා රත් කරයි. එවිට පිට වූ වායුව 0.1 $moldm^{-3}$ HCl ද්‍රාවණයක 25.0 $cm^3$තුලට යවන ලදී. ඉන්පසු එම ද්‍රාවණය සුදුසු දර්ශකයක් හමුවේ 0.1 $moldm^{-3}$ NaOH සමඟ අනුමාපනය කරන ලදී. බියුරෙට්ටු පාඨාංකය 10.0 $cm^3$ක් වේ.

ක්‍රියා පිළිවෙල 02

ඉහත ද්‍රාවණයෙන් තවත් 25.0 $cm^3$ ගෙන එයට වැඩිපුර $CaCl_2$ ද්‍රාවණයක් එකතු කරන ලදී. ලැබෙන අවක්ෂේපය පෙරා වියළා නියත ස්කන්ධයක් ලැබෙන තුරු තදින් රත් කරන ලදී. එහි දී පිට වූ වායුව ස.උ.පී. දී එකතුකරන ලදී. එහි පරිමාව 44.8 $cm^3$ වේ. ($CaC_2O_4$ රත් කිරීමේ දී වියෝජනය නොවේ)

ක්‍රියා පිළිවෙල 03

1$moldm^{-3}$$KI$ ද්‍රාවණයක 10.0 $cm^3$ ක් සමඟ සම්පූර්ණ ලෙස ප්‍රතික්‍රියා වීමට $KMnO_4$ ද්‍රාවණයකින් 25.0 $cm^3$වැය විය. ඉහත අයන අඩංගු ද්‍රාවණයෙන් වෙනත් 25.0 $cm^3$ ක් එම $KMnO_4$ සමඟ අනුමාපනය කරන ලදී. අන්ත ලක්ෂ්‍යයේ දී බියුරෙට්ටු පාඨාංකය 20.0 $cm^3$ විය. (ප්ලාස්කුව තුල ඇති අයන අනුමාපනයට බාධා ඇති නොකරයි)

(i) ක්‍රියා පිළිවෙල 01/02/03 ට අදාලව සිදුවන සියලුම ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

(ii) ද්‍රාවණයේ $NO_3^-/C_2O_4^{2-}/CO_3^{2-}$ අයන වල සාන්ද්‍රණ ගණනය කරන්න.

(ස.උ.පී. හිදී වායුවක මවුලික පරිමාව 22400 $cm^3mol^{-1}$)

AL API ( PAPERS GROUP )



CamScanner

AL API

PAPERS GROUP

CS CamScanner